ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපළ පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ACA – 6 ආකෘතියේ සඳහන් එකතුව රු.2,478,089,671 ක් වූ ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර එහි නිවැරදිතාවය තහවුරු කරගෙන නොතිබුණි.	2023 වර්ෂයට අදාලව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් දිසාපති නිල නිවස හැර අනෙකුත් සියළුම ආයතන වල භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර අදාල වාර්තා සකස් කර ජුනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව. 2024 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයන් මේ වන විට කෙරී ගෙන යන බව.	භාණ්ඩ සමීක්ෂණය පවත්වා වත්කම් ශේෂයේ නිවැරදිතාවය තහවුරු කළ යුතුය.
(ii)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6) අනුව 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ අවසන් වාර්තා 2024 ජුනි 15 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් වලපනේ, නුවරඑළිය, අඹගමුව, නෝර්වුඩ් හා තලවකැලේ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු දිසාපති නිල නිවස ඇතුළු රජයේ පොදු සේවා නිවාස 64 ක භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ අවසන් වාර්තා විගණකාධිපති වෙත 2025 අප්‍රේල් 30 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.	අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය "අපහරණයන්" යටතේ ද නෝර්වුඩ් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එම වටිනාකම "ආරම්භක ශේෂයට එකතුවීම්" යටතේ ද දක්වා ඇති බැවින් මූල්‍ය නොවන වත්කම්වල අඩු වීමක් සිදු වී නොමැති බව.	භාණ්ඩ සමීක්ෂණ සිදුකර නියමිත කාලය තුළ වාර්තා ඉදිරිපත් කළ යුතුය.

(ආ) අග්‍රිම ශේෂය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍යපරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ සංචාරක බංගලා භාරකරුවන්ගේ හා සහයක නිල නිවාස ඉදිකිරීම සඳහා 2012 ක් වූ මාර්තු මස 21 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත්කරුවකු සමඟ එළඹි ගිවිසුමෙහි, අත්තිකාරම් ඇපකරයේ කොන්දේසි හා නියමයන් ප්‍රකාරව අදාළ ඉදිකිරීම ඉටුකිරීමට අපොහසත් වීම මත රක්ෂණ සමාගමින් අයවිය යුතු රු. 900,878 ක ශේෂය 2024 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබීම මත වර්ෂ 12 සිට පැවත එන අග්‍රිම ශේෂය නිරවුල් කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් සී/ස සමූපකාර රක්ෂණ සමාගම වෙත යොමු කරන ලද එන්තරවාසියේ පිටපතක් අප වෙත ලබා දී ඇති අතර එම පිටපත විගණනය සිදු කරන අවස්ථාවේ දී ඔබ වෙත ලබා දීමට කටයුතු කර ඇත.මෙහි ඉදිරි කටයුතු ක්‍රියාත්මත කිරීම අපගේ පාලනයෙන් තොර වන අතර එය නීතිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.පියවීම කළ හැක්කේ අදාල මුදල අය වූ පසුව බව.	අදාළ ආයතන සමඟ සාකච්ඡා කර හා පසුවිපරම් සිදු කර නොපියවූ අත්තිකාරම් ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ
.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6.1(ආ) නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය තුළදී මුදල් රෙගුලාසි 94 ට හා 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 ඡේදයට අනුකූල නොවන ලෙස වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.362,201 ක බැදීම් ඇතිකරගෙන තිබුණි.	1002 සහ 1101 යටතේ දක්වා අයවැය මඟින් ලබා දී ඇත ප්‍රතිපාදන වර්ෂය අවසානයේ ප්‍රමාණවත් නොවීය.එබැවින් 1101 වැය විෂය යටතේ දක්වා ඇති නිළධාරි ගමන් වියදම් සහ 1002 යටතේ දක්වා ඇති අතිකාල ගෙවීම සඳහා අවශ්‍යතාවයට ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇති කර ගැනීමට සිදු වූ බව.	ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් ඇතිකර ගැනීමට අදාළ අධීක්ෂණය නොකළ හා වගකිවයුතු පාර්ශව වෙත පියවර ගැනීමත්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට වැඩපිළිවෙලක් හඳුන්වාදීමත් කළ යුතුය.

3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් විවිධ ව්‍යාපෘති හා කාර්යයක් සඳහා 2023 හා 2024 වර්ෂවල අවස්ථා 05 කදී හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ලබාදෙන ලද රු.14,022,277 ක මුදල් අදාල කාර්ය ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	ජාතික ශිල්ප සභාවට ඇණවුම් ඉදිරිපත් කර භාණ්ඩ නොලැබීම, භාණ්ඩ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පැවතීම, ඉදිකිරීම් කටයුතු අවසන් වන ආකාරය අනුව වාරික වශයෙන් ගෙවීම් කටයුතු කිරීම, මිලදී ගැනීමට අපේක්ෂිත භාණ්ඩවල තාක්ෂණික පිරිවිතර ලබාගැනීම ප්‍රමාද වීම මත ප්‍රතිපාදන රඳවාගත් බව.	ප්‍රතිපාදන අදාළ අරමුණු වෙනුවෙන් කාලීනව පූර්ණ ලෙස උපයෝජනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
(i)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 න් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)	යම් නිශ්චිත කාර්යයක් සඳහා දෙන ලද අතුරු අග්‍රිම එම කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක නිලධාරීන් විසින් අවස්ථා 07 කදී දෙන ලද එකතුව රු.280,025 ක්වූ අතුරු අග්‍රිම පියවීමට දින 25 සිට දින 46 දක්වා ප්‍රමාද කර තිබුණි.	ඉදිරියේදි චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර පියවීමට කටයුතු කරන බව.	විධිමත් පරීක්ෂාවක් සිදුකර පියවීම් ප්‍රමාද කිරීම තුළ මූල්‍ය අවභාවිතයක් සිදු වී ඇත්නම් අදාළ පාර්ශව වෙත පියවර ගැනීමටත් ඉදිරියේදී අනුකූලතාවය පවත්වා ගැනීම තහවුරු වන වැඩපිළිවෙලක් යෙදීමත් කළ යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 570(2)	කල් ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත්, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.60,000 ක පරිපාලන වියදම් සඳහා වූ තැන්පතුවක් 2006 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි	පරිපාලන වියදම් වලින් කොටසක් දැනට වියදම් කර ඇත. පරීක්ෂණ අවසන් වීමෙන් පසු ඉතුරු වී ඇති පරිපාලන වියදම් නිරවුල් කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර කඩිනමින් නිරවුල් කළ යුතුය.

(ආ)	2024 වර්ෂයේ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.2 සහ 2.2.3 ඡේදයන්	එක් සේවා ස්ථානයක වසර 05 කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක නිලධාරින් 100 දෙනෙකු වසර 06 සිට වසර 26 දක්වා කාලයක් එකම සේවා ස්ථානයක සේවය කරමින් පැවතුණි.	වර්ෂ 05කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් වාර්ෂිකව ස්ථානමාරු ඉල්ලුම් කරනු ලබන නමුත් වාර්ෂික ස්ථානමාරු නොලැබීම මත එකම ස්ථානයේ රැඳී සිටීමට සිදුවන බව.	ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව කටයුතු කළ යුතුය.

3.4 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1941 වර්ෂයේදී පමණ ඉදිකර තිබුණු රජයේ ක්‍රීඩා සමාජ ශාලා ගොඩනැගිල්ල රු.21,800,000 ක වටිනාකමක් සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගතව තිබියදි 80 දෙනෙකුගේ සාමාජිකත්වය සහිත ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් 10 දෙනෙකු පමණක් රැස්වී 2024 ජුනි 12 දින මාසික සභාවක් පවත්වා වසර 20 සඳහා මෙම ගොඩනැගිල්ල බදු පදනම මත බාහිර පාර්ශවයකට රාත්‍රී සමාජ ශාලාවක් පවත්වාගෙන යාමට බදු පදනමට ලබාදී තිබුණි. මෙම රැස්වීමට සහභාගිවූ බවට අත්සන් කළ නිලධාරියෙකු එදින වෙනත් රාජකාරි කටයුත්තක නිරත වී තිබු බැවින්, අත්සන් ලේඛනයද පිළිගත හැකි තත්ත්වයක නොවීය. ඒ සඳහා වංචල දේපලක් ලෙස ව්‍යාපාරක් බදු දීම සඳහා ගිවිසුමක් සකස් කර ඒ තුල ගොඩනැගිල්ල බදු දීම සඳහා වන කොන්දේසි ඇතුළත් කර තිබුණි. මෙම ස්ථානය සඳහන් වන ක්‍රීඩා සමාජයට අයත් මත්පැන් බලපත්‍රය දිස්ත්‍රික් ලේකම්වරයාගේ රු.1,128,500 ක පෞද්ගලික වියදමින් අලුත් කර මෙම ස්ථානයේ මත්පැන් අලෙවියට ඉඩ සලසා දී තිබුණි. බාහිර පාර්ශවයකට බදු පදනම මත ලබාදීමට ප්‍රථම, මෙම ගොඩනැගිල්ලේ පවත්වා ගෙන යනු ලැබු ක්‍රීඩා සංගමය සහ එහි උපකරණ ස්ථාපනය කිරීම සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ 2024 වර්ෂයේ පිළිවෙළින්	අදාල කරුණු සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා සුදුසු ස්වාධීන කමිටුවක් පත් කර එමගින් වාර්තාවක් ලබා ගැනීමට යෝජනා කර ඇති අතර ඒ අනුව අදාල පිළිතුරු ඔබ වෙත යොමු කිරිමට කටයුතු කරන බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා රාජ්‍ය දේපළ අවභාවිත කර තිබේ නම් අදාළ පාර්ශව වෙත විධිමත් පරිදි කටයුතු කළ යුතුය..

රු.3,200,000 සහ රු.2,000,000 ක් වශයෙන් රු.5,200,000 ක ප්‍රතිපාදන මත ගොඩනැගිල්ලක් ක්‍රීඩා සමාජ ශාලා ගොඩනැගිල්ලට යාබදව ඉදිකර තිබුණි. 2024 විමධ්‍යගත අයවය වැඩසටහන යටතේ අනුමත කර තිබුණු ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති 03 කට වෙන්කරන ලද රු.3,200,000 ක ප්‍රතිපාදන අවලංගු කර මෙම ගොඩනැගිල්ල සඳහා මූල්‍ය ප්‍රතිපාදන සපයාගෙන තිබුණි.

3.5 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාය යැම් අධි අවධානම් හේතුවෙන් නැවත පදිංචි කිරීමේ වැඩසටහනට ඇතුළත් කරගන්නා ලද ප්‍රතිලාභීන් 12 දෙනෙකු වෙත ගෙවිය යුතු 2022 වර්ෂයේ තැන්පත් කරන ලද රු 300,000. ක මුදල් 2024 දෙසැම්බර් 31 දින වන විට තැන්පත් කර වර්ෂ දෙකක් ඉක්මවා ගොස් තිබුණද, අදාල ප්‍රතිලාභීන්ට ගෙවීම සඳහා හෝ මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර රාජ්‍ය ආදායමට බැර කිරීම සඳහා කටයුතු කර හෝ නොතිබුණි.	මේ වන විට රජයේ ආදායමට බැර කර ඇති බව.	විධිමත් පරීක්ෂණයක් සිදුකර අරමුණුගත කාර්යට ප්‍රතිපාදන නොයෙදීම පිළිබඳ වගකිව යුතු පාර්ශව වලට පියවර ගත යුතුය.
(ආ)	පුද්ගලික සමාගමක් විසින් හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආගමික ස්ථාන සඳහා සූර්ය බල පහසුකම් ලබාදීම සඳහා 2020 වර්ෂයේදී ලද රු.1,297,770 ක් හා 2021 වර්ෂයේදී ලද 994,445 ක මුදල් තැන්පත් කර වර්ෂ දෙකකට වැඩි කාලයක් ගතවී තිබුණද, මුදල් භාවිතා කර ආගමික ස්ථාන සඳහා සූර්ය බල පහසුකම් ලබාදීමට හෝ මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර සුදුසු පරිදි රාජ්‍ය ආදායමට බැර කිරීම හෝ සිදුකර නොතිබුණි.	මේ වන විට රජයේ ආදායමට බැර කර ඇති බව.	ප්‍රතිපාදන අදාළ අරමුණු සඳහා පූර්ණ ලෙස උපයෝජනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.
(ඇ)	හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විවිධ ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට හා වෙනත් කාර්යයන් වෙනුවෙන් 2020-2021 කාලය තුළ අවස්ථා 06 කදී තැන්පත් කරන ලද රු.2,092,852 ක් තැන්පත් කර වර්ෂ 03 සිට වසර 22 දක්වා කාලපරාසයක් ඉක්මවා ඇතත්, නිරවුල් කිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	ඉඩමේ අයිතිය කවුරුන් දැයි තීරණය කිරීමට නොහැකි බැවින් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 10(1) වගන්තිය යටතේ දිසා අධිකරණයට යොමු කර ඇති බව.	විධිමත් පරිදි කටයුතු කර නිරවුල් කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය.

(ඇ)	අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ වැලිඔය ඉහළ කොටස ප්‍රජාශාලාව දක්වා යන මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් ග්‍රාම සංවර්ධන සමිතිය සඳහා ලියන ලද රු. 731,250 ක චෙක්පත නිකුත් කර මාස 06 ඉක්ම වීම හේතුවෙන් පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි	වැලිඔය ඉහළ කොටස ප්‍රජා ශාලාව දක්වා මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් ලියන ලද රු.731,250.00 ක මුදල 2025.03.17 දින රජයේ ආදයමට බැර කර ඇති බව.	අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කර වගකිව යුතු පාර්ශව වෙත පියවර ගත යුතුය.
(ඉ)	කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා අධි අවධානම් කලාපවල පවුල් යලි පදිංචි කිරීම යටතේ වෙදමුල්ල නිවාස ව්‍යාපෘතියේ වාරික ගෙවීම්වල රඳවා ගැනීම් මුදල් ලෙස රු.1,125,000 ක් 2023 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දින වන විටත් අදාල මුදල් ප්‍රතිලාභීන්ට ගෙවීමට කටයුතු කර නොතිබුණි.	මෙම රඳවුම් මුදල ප්‍රතිලාභියා වෙත නිදහස් කිරිම සඳහා ඉදිකිරීම්හි ගුණාත්භාවයත් සමඟ කරුණු කිහිපයක් සලකා බැලීමට උපදෙස් ලබා දී ඇති අතර සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කිරීමෙන් අනතුරුව පමණක් රඳවුම් මුදල් එකවර ගෙවීම් කළ යුතු බැවින් ප්‍රතිපාදන රඳවාගෙන සිටි බව හා නිදහස් කරන බව.	විධිමත් වැඩපිළිවෙලක් යොදා අදාළ කටයුතු ගුණාත්මකභාවයෙන් නිමකර රඳවුම් මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.
(ඊ)	වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂයේ කළු බුලත් මිලදී ගැනීම වෙනුවෙන් ලද රු.1,999,200 ක් පොදු තැන්පතු ගිණුමේ තැන්පත්කර වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වුවද සුදුසු පරිදි කටයුතු කර අදාළ ප්‍රතිලාභින්ට නිරවුල් කිරිමට හෝ මුදල් රෙගුලාසි 571 පරදි කටයුතු කර රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.	මේ වන විට රාජ්‍ය ආදායමට බැර කර ඇති බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර අරමුණුගත කාර්යයට ප්‍රතිපාදන යොමු නොකළ පාර්ශවලට එරෙහිව පියවර ගත යුතුය.
(උ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 03 ක් විසින් 2020-2022 කාලය තුළ ඉටුකරන ලද කර්මාන්ත වලින් රඳවාගැනීම් ලෙස පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණු එකතුව රු.2,409,901 ක් වු තැන්පතු 09 ක් තැන්පත් කර වර්ෂ 02 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.	දෙදෙනෙකුගේ මුදල් නිදහස් කිරීමට කටයුතු කර ඇති අතර, අනෙක් මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන ලද බව.	අදාළ මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නිරවුල් කළ යුතුය.
(ඌ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ඉඩම් අත්පත් කර ගත් ප්‍රතිලාභීන් 69 දෙනෙකුගේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිරවුල් කර වන්දි ලබා දීම සිදු නොකර 2014-2019 කාලය තුළ ලද රු.890,527,783 ක ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි තැන්පත් කර වර්ෂ 5 ත් 10 ත් අතර කාලයක් හා ප්‍රාදේශීය	මෙම ඉඩම් අත්පත් කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් සිදුවෙමින් පවතින අතර ක්‍රියාවලිය අවසානයේ වන්දි ගෙවිමේ කටයුතුද සිදු කරන බව.	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කඩිනම් කර වන්දි ලබාදීම සිදු කළ යුතු වීම.

ලේකම් කාර්යාල 03 ක ප්‍රතිලාභීන් 103 දෙනෙකු වෙනුවෙන් ඉඩම් වන්දි ගෙවීම සඳහා ලද රු.20,093,763 ක් තැන්පත් කර වර්ෂ 10 ත් 18 ත් අතර කාලයක් ගත වී තිබුණ ද ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිරවුල් කර වන්දි ලබා දීමට කටයුතු කර නොතිබුණි.

3.6 බැංකු ගිණුම් මෙහෙයවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේදී නිකුත් කරන ලද රු.4,541,080 ක් වටිනා චෙක්පත් 6ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	නඩු සඳහා රජයේ නීතිඥවරයා වෙත චෙක්පත් භාරදී ඇතත් අදාල නඩු ඉල්ලා අස්කර ගැනීමෙන් පසු අදාළ චෙක්පත් කාර්යාලයට මෙතෙක් භාර දි නොමැති බව.	අදාළ මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නිරවුල් කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දසවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක "කඳුකර දශකය 2024 - 2033" යටතේ ව්‍යාපෘතිය සඳහා අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට රු. මිලියන 100 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. එම ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට 2024 මාර්තු 21 දින අනුමත කළ ව්‍යාපෘති 09 ක් ඉඩම් ගැටළු, ප්‍රජා සමිති ඉදිරිපත් නොවීම, NBRO වාර්තා නොමැති වීම, ප්‍රමාණවත් තාක්ෂණ නිළධාරීන් නොමැතිවීම හා ප්‍රාදේශීය සභාවට පැවරූ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම වැනි හේතූන් මත ව්‍යාපෘති අත්හැරීමෙන් එකතුව රු මිලියන 13.7 ක ප්‍රතිපාදන නැවත පවරා දී තිබුණි.	ව්‍යාපෘති 09 ක් ඉටු කිරීමට ගත් සියළු ක්‍රියා මාර්ග හා ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම පිළිබඳව ගත් ක්‍රියාමාර්ග ඇතුළුව කාර්යාලයේ පැවති ව්‍යාපෘති ප්‍රමාණය ඉටු කිරීමේදී කාර්මික නිලධාරීන් එක් අයකු පමණක් සිටීම මගින් සිදු වූ අපහසුතාද පැවති බව.	ප්‍රතිපාදන පූර්ණ ලෙස උපයෝජනය සඳහා කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.
(ආ)	ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ වතුකරයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ ඉදිකිරීම් 13 ක් සහ මිලදී ගැනීම් 06 ක් වෙනුවෙන් රු.21,000,000 ක ප්‍රතිපාදන 2024 ජූලි 24 දින අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලට ලබාදී තිබුණද, 2024 දසැම්බර් 10 වන විට එම කාර්යයන් ඉටු නොකර මුදල් ආපසු පවරා දී තිබීමෙන් වතුකරයේ ජනතාවගේ ජීවනෝපාය ඉහළ දැමීම වෙනුවෙන් වතුකරයේ යටිතල	කාර්මික නිලධාරීන්ගේ හිඟය හා ව්‍යාපෘති සම්බන්ධීකාරක වෙතින් ව්‍යාපෘති සංශෝධනය සඳහා අනුමැතිය නොලැබීම හා මැතිවරණ 02ක් පැවතීම නිසා ඒ ඇතුලත කාලය තුළ ව්‍යාපෘති නතර කිරීමට සිදුවීම මුලික හේතු බව.	- එම -

	පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණු ඉටු කර ගැනීමට අපොහොසත් වි තිබුණි.		
(ඈ)	නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පීඩෘවත්ත ශ්‍රී මුත්තුමාරි අම්මාන් කෝවිල අසල පැති බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.1,455,000 ක වටිනාකමක් සහිතව 2024 සැප්තැම්බර් 01 දින නිම කිරීම සඳහා සමිතියක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. එහෙත් 2024 දෙසැම්බර් 12 වන විටත් ගිවිසුම්ගත වී තිබුණු කාර්යයන් ගෙන් සියයට 40 ක පමණ වැඩ ප්‍රමාණයක් ඉටු නොකර අතහැර දමා තිබුණි. ඒ අනුව ඉටුකර ඇති කාර්යයන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.737,382 ක මුදලක් ගෙවා තිබුණද, ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.	සමිතිය විසින් ඔවුන්ට පාඩු බව දන්වමින් ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් ඔවුන්ගෙන් ප්‍රමාද ගාස්තු අයකිරීමට නොහැකි බව.	නියමිත කාලය තුළ අපේක්ෂිත පරිදි ව්‍යාපෘති නිම කරවා ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතු අතර විධිමත් අධ්‍යයනයක් කර අතහැර ඇති ව්‍යාපෘති නිම කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබාදී මාස 04 කට අධික කාලයක් ගතවී තිබුණු රු.3,492,000 ක ගිවිසුම් වටිනාකම් සහිත ව්‍යාපෘති දෙකක් එම ව්‍යාපෘති නිම කළ යුතු දිනය ඉක්මවා මාස 02 ක කාලයක් ගතවී තිබුණද, එම ව්‍යාපෘති ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. ඉදිකිරීම් සඳහා ගිවිසුම් ගත වී තිබුණු ව්‍යාපෘති භූමිය 2024 දෙසැම්බර් 12 දින භෞතිකව පරීක්ෂාවේදී ඉදිකිරීම් ද්‍රව්‍ය හෝ උපකරණ ආදි කිසිවක් ඉදිකිරීම් භූමිය තුල නොතිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම් කඩ කර තිබුණු ප්‍රජා පාදක සංවිධානවලට අදාලව 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ චක්‍රලේඛයේ 2.6 ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබාදීම සඳහා කාර්මික නිලධාරීන් විසින් සාවද්‍ය වාර්තා ලබාදී තිබුණි.	ව්‍යාපෘතින් දෙකෙහිම වැඩ ආරම්භ කිරීම සඳහා අත්තිකාරමට වඩා මිලකළ හැකි ගල්,වැලි,සිමෙන්ති වැඩබිමට ගෙනැවිත් තිබුණු බැවින් අත්තිකාරම් මුදල් ලබා දුන් අතර එවිට පැවති වර්ෂා සහිතව තත්වය හා ඔවුන්ගේ පාරිසරික අපහසුතා මත ඉදිකිරීම් කටයුතු සිදු නොවිය. අත්තිකාරම් මුදල නැවත අයකරගැනිමට කටයුතු කළ අතර එම ප්‍රතිපාදන නැවත රජයට පවරන ලදී. මෙම සමිතිය අසාදු ලේඛන ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලද බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර අක්‍රමිකතා සිදු කර ඇති නිලධාරීන්ට හා ව්‍යාපෘතිය කාලීනව ඉටු කර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.

4.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මන්දාරම්නුවර ගුඩ්වුඩ් හි විවෘත නැරඹුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අවසන් බිල්පත්‍රයෙහි අයිතම 18 යටතේ, අත්වැට ඉදිකිරීම (Hand Rail) වෙනුවෙන් වර්ග මීටර් 73 ක් සඳහා ඒකකයකට රු.12,000 (SSR) බැගින් එකතුව ලෙස රු.876,000 ක් ගෙවා තිබුණි. නමුත් විගණිත දිනය වූ 2025 ජනවාරි 31 දින වන විටත්, අදාළ අයිතමය ඉටුකර නොතිබුණි.	2024 වර්ෂයේ නොවැම්බර් මස සිට 2025 ජනවාරි මාසයේ අග දක්වාම අඛණ්ඩව පැවති වර්ෂාව හේතුවෙන් ව්‍යාපෘතියේ අවසන් කාර්ය වූ අත්වැට සකස් කිරීමට යම් කාලයක් ප්‍රමාද වූ අතර අනතුරුව ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක ලෙස නිමකර අදාල චෙක්පත 2025.02.11 දින අදාල පාර්ශව වෙත ලබා දී ඇති බව.	කාර්යය නිම කිරීමට පෙර ගෙවීම් නිර්දේශ කර, අනුමත කර සහතික කර චෙක්පත් ලියා අත රඳවාගත් නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය..

4.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කඳුකර දශකය 2024 – 2033 දශවිධ විශේෂ ඒකාබද්ධ වැඩසටහන යටතේ 2024 දෙසැම්බර් 12 වන විටත් ගිවිසුම්ගත වී මාස 04 ත් 05 ත් අතර කාල පරාසයක පැවති රු.3,201,000 ක ව්‍යාපෘති 03 ක් වැඩ ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘති තෝරා ගැනීමේදී සහ අනුමත කිරීමේදී ප්‍රාදේශීයව ඉහළම අවශ්‍යතාවය සහිත ව්‍යාපෘති තෝරා නොගැනීමත් අදාල ව්‍යාපෘති නියමිත කාලය තුල ඉටු කරවා ගැනීමට කටයුතු කිරීම හෝ ව්‍යාපෘති ඉටු නොකරන්නේ නම් ප්‍රමුඛතාවය ඇති වෙනත් ව්‍යාපෘතියක් සඳහා අදාල ප්‍රතිපාදන යෙදවීමට කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය සංවර්ධන කටයුතු සඳහා රාජ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමේ අරමුණු ඉටු වී නොතිබුණි.	ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය මගින් සෘජුවම මෙම ව්‍යාපෘති යෝජනා ලබාදුන් අතර වසම්වල සමිති මගින් දිගින් දිගටම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බව පැවසුවත් ව්‍යාපෘතිය දෙසැම්බර් අවසන්වන තෙක්ම සිදු නොකළ අතර එබැවින් මෙම ව්‍යාපෘතිවලට අදාලව ප්‍රතිපාදන නැවත රජයට පවරාදීමට කටයුතු කරන ලද බව හා අසාදු ලේඛන ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලද බව.	සැලැස්මක් හා විධිමත් අධීක්ෂණයක් තුළින් කඩිනමින් කර්මාන්ත නිම කිරීමට ක්‍රියාමාර්ග නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.

4.4 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විධිමත් ග්‍රාමීය සංවර්ධනයක් බිහි කිරීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමේ අපේක්ෂාවෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය ව්‍යාපෘති 03 සඳහා ලබාදුන් රු.3,200,000 ක ප්‍රතිපාදන, විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024 මැයෙන් යුතු 2023 දෙසැම්බර් 29 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක MF/02/2023 චක්‍රලේඛයේ නියමයන්ගෙන් බැහැරව ව්‍යාපෘති අවලංගු කර රජයේ සේවකයන්ගේ කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා මුදල් වැයකර තිබුණි.	මෙම ව්‍යාපෘති තුනම 2024.06.12 දින වන විටත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.එමෙන්ම නුවරඑළිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිතුමන් විසින් විවිධ හේතුන් මත ක්‍රියාත්මක කිරීමට නොහැකි ව්‍යාපෘති පවතී නම් එම ව්‍යාපෘති අවලංගු කර එම ප්‍රතිපාදන වලින් රු.3,500,000.00 ක් රාජ්‍ය සේවකයින්ගේ කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා යොදවන ලෙස උපදෙස් ලබා දී ඇති බව.	විධිමත් පරීක්ෂණයක් සිදු කර අරමුණුගත කාර්යයෙන් පරිබාහිරව ප්‍රතිපාදන උපයෝජනය කළ නිලධාරීන්ට එරෙහිව විධිමත් පියවර ගත යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එළමුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිශ්‍රයේ , ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපෘතිය මගින් 2018 වර්ෂයේදී රු.6,900,000 ක මුළු පිරිවැයක් සහිතව ඉදිකර තිබුණු බීජ බෝංචි ගබඩා කිරීමේ ගොඩනැගිල්ල හා ශීතාගාරය 2025 ජනවාරි 31 වන විගණිත දිනය වන විටත් නිශ්කාර්යව පැවතුණි.	මෙම ශීතාගාරය ඉදිකිරීමේ මූලිකව අරමුණ වූයේ බෝංචි බීජ සඳහා මිල ස්ථාවරත්වයක් ඇති කිරීම වන අතර මේ වන විටත් බෝංචි බීජ මිල ඉහල තත්වයක පවතින බැවින් එසේ ගබඩා කිරීම මේ වර්ෂයේ අනවශ්‍ය බව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මධ්‍යම බීජ පරීක්ෂණාගාරය, පේරාදෙණිය මගින් කළ ඉල්ලීම සම්බන්ධව අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරන බව.	විධිමත් අධ්‍යයනයක් සිදුකර අදාළ වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කර ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.
(ආ)	2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු.8,456,250 ක ප්‍රතිපාදන මත හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කෝපි බීජ නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. විගණිත දිනය වූ 2025 ජනවාරි 31 දින වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වර්ෂ 03 කට වැඩි කාලයක් ගතවී තිබුණද, පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ රු.3,234,843 ක් වැයකර ඉදි කරන ලද හුණුකොටුව “කෝපි බීජ ගබඩා කරන	මෙම මධ්‍යස්ථාන සඳහා කෝපි පොත් ඉවත් කිරීමේ යන්ත්‍ර 7ක් මිලදී ගෙන ඇති අතර එම යන්ත්‍ර මේ වන විට ක්‍රියාත්මක නොවන මට්ටමේ පවතින්නේ එම කෝපි බීජ එකතු කිරීම මධ්‍යස්ථාන සඳහා විදුලි බලය නොමැති වීම නිසා බව.	විධිමත් අධීක්ෂණයක් හා නියාමනයක් සිදුකර මෙම ව්‍යාපෘති මගින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු සිදු නොකරන වගකිව යුතු නිලධාරීන්ට පියවර ගැනීමටත්,

	මධ්‍යස්ථානය හා ඉඩම්පිටිය හා මැටිබැඹිය ග්‍රාම නිලධාරි වසම්වල එකතුව ලෙස රු.523,000 ක් වැය කර නවීකරණය කරන ලද කෝපි බීජ එකතු කිරීමේ මධ්‍යස්ථාන දෙක ද, නිෂ්කාර්යව පැවතුණි. තවද, ඉඩම්පිටිය හා මැටිබැඹිය කෝපි බීජ එකතු කිරීමේ මධ්‍යස්ථාන සඳහා විදුලි සම්බන්ධතාව ලබාගෙන නොතිබීම හේතුවෙන් රු.1,860,000 ක් වැයකර මිලදී ගෙන ඇති කෝපි පොත්ත ඉවත් කිරීමේ යන්ත්‍ර" 07 ද දැනට වර්ෂ 03 කට වැඩි කාලයක් නිශ්කාර්යව පවතින බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.		ව්‍යාපෘතිය ඵලදායී කර ගැනීම සඳහා වැඩ පිළිවෙලක් සැකසීමත් කළ යුතුය.
(ඇ)	ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදුන් ට්‍රැක්ටර් රථයක් සහ එහි ට්‍රේලරය හා 2017 අගෝස්තු 02 වන දින ලබාදී ඇති ජල බවුසරය 2020 ඔක්තෝබර් මාසයෙන් පසුව භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.	මෙම ට්‍රැක්ටර් බවුසරය කඳපොල බීජ අර්තාපල් ගොවිපලට ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	ඵලදායි කටයුත්තක් සඳහා උපයෝජනය කිරීමට හෝ විධිමත් පරිදි කටයුතු කර වෙනත් ආයතනයකට පැවරීමට කටයුතු කළ යුතුය

4.6 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි රජයේ ඉඩම්වල රජයට ඇති අයිතිය ආරක්ෂා කිරීම සඳහා ග්‍රාම නිලධාරීන් විසින් තම වසම් මට්ටමින් අනවසර අල්ලා ගැනීම් සිදුවන්නේද යන්න පිළිබඳව නිරතුරු සුපරීක්ෂාකාරි වෙමින් සැම දෙසතියකටම වරක් එවැනි අල්ලා ගැනීමක් සිදුවීද යන්න පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයා වෙත වාර්තා කළ යුතු නමුත් හඟුරන්කෙත හා අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්වල ග්‍රාම නිලධාරි වසම් 37 ක ග්‍රාමනිලධාරින් විසින් නියමිත පරිදි දෙසති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	පසුගිය වර්ෂයට අදාලව දෙසති වාර්ථා නිවැරදිව ලබා ගෙන සම්පූර්ණ කල අතර ඉදිරි වර්ෂ වලදි නිසි ආකාරයෙන් වාර්තා ලබා දිමට පියවර ගන්නා ලෙස ග්‍රාම නිලධාරින් දැනුවත් කල බව	නියමිත පරිදි අනවසර අල්ලා ගැනීම් පිළිබඳ දෙසති වාර්තා ඉදිරිපත් නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත් දෙසති වාර්තා නිසි පරිදි ලැබෙන බව තහවුරු වන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමත් කළ යුතුය.
(ආ)	ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 ක විශ්‍රාමිකයන් 06 දෙනෙකු වෙත රු.1,624,561ක් ජීවන වියදම් දීමනා සහ පාරිතෝෂික දීමනා වැඩිපුර ගෙවා තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන වන විට එයින් ආපසු අයකර ගත යුතු මුදල රු 537,618 ක් විය. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 3/2022 හා 2022 ජූනි 10 දිනැති විශ්‍රාම වැටුප්	මෙම ශේෂය අයවිමට අදාලව කමිටුවක් පත්කර එම කමිටුවේ තීරණ මත ඉදිරි කටයුතු සිදු කළ යුතු බව හා බොහෝ ශේෂ දැනටමත් අයවෙමින් පවතින බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවීම් සඳහා නිලධාරීන්ගේ මැදිහත්වීමක් තිබේද යන්න සොයා බලා කටයුතු කිරීමටත් අදාළ චක්‍රලේඛ විධිවිධාන අනුව

	චක්‍රලේඛයේ අංක 07 ඡේදය අනුව විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කටයුතු කළ යුතු අතර ඒ සඳහා රජයේ මුදල් රෙගුලාසි 101 සිට 113 දක්වා වූ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ 2 කාණ්ඩයේ විධිවිධානද ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අනුගමනය කළ යුතු බව දක්වා ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.		කටයුතු කර වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් අයකර ගැනීමත් හා විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම වළක්වා ගැනීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගෙන යා යුතුය .
(ඈ)	මධ්‍යම පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට සමාලෝචිත වර්ෂය තුල ලද රෝගී තත්ත්වයට පත් පවුල් සවිබල ගැන්වීමේ, තනි මාපිය පවුල් සවිබල ගැන්වීමේ හා ආබාධිත පුද්ගලයින් වෙනුවෙන් ආධාර ලබාදීම සඳහා ලද රු.462,500 ක් අදාල අරමුණු වෙනුවෙන් වැය නොකර 2025 ජනවාරි 31 විගණිත දිනය වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	ආධාර සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බවත් ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර ලබාදීම වෙනුවෙන් තුන්වැනි වාරිකය ලෙස ඉතිරිව ඇත්තේ රු.150000ක මුදලක් පමණක් බවත් එම මුදලද ලබා දුන් දෙවැනි වාරිකයේ ප්‍රගතිය පරීක්ෂා කර ලබාදීමට කටයුතු කරමින් පවතින බව.	අදාළ අරමුදල් ඵලදායි ලෙස අරමුණු කරා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මුදල් රෙගුලාසි අංක 149 අනුව පැවරී ඇති වගකීම් නිසිලෙස ඉටු නොකිරීම හේතුවෙන් හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රජයේ ඉඩම් බදු අයකිරීමේදී එම විධිවිධාන අනුව කටයුතු කර දීර්ඝ කාලීන පදනම මත වාණිජ කටයුතු සඳහා බදු දී ඇති රජයේ ඉඩම්වලට අදාලව රු.26,577,744 ක බදු මුදල් අයකර ගෙන නොතිබුණි.	අයකර ගැනීමටකටයුතු කරමින් පවතින බව.	විධිවිධාන ප්‍රකාරව බදු මුදල් අය නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමටත් මුදල් රෙගුලාසි අනුව කාර්යක්ෂමව කටයුතු කර බදු ආදායම් රැස් කිරීමටත් කටයුතු කළ යුතුය.
(ඉ)	මධ්‍යම පළාත් සභාවේ මුදල් රීති සංග්‍රහයේ 116.3 වගන්තිය ප්‍රකාරව වාර්ෂික බදු පදනම මත ලබා දී ඇති ඉඩම් සඳහා වාර්ෂික බදු මුදල අප්‍රමාදව අය කර ගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් වාර්ෂික බදු ලෙස අයවිය යුතු රු.1,817,371 ක මුදල් 2024 දෙසැම්බර් 31 දින වන විටද අයකර නොතිබුණි.	වාර්ෂික හිඟ බදු ගෙවීම සඳහා 09 දෙනකුට ලිඛිතව දැනුම් දී ඇත.ඒ අනුව එක් අයකු හිඟ බදු ගෙවා ඇත. මුදල් ගෙවූ රිසිට්පත අමුණා ඇත. තවද, මේ සම්බන්ධයෙන් ඉදිරියේදී දැඩි අධීක්ෂණයක් පවත්වාගන යැමට කටයුතු කරන බව.	කාලීනව බදු අය නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමටත් මුදල් රීති සංග්‍රහයේ අපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම.
(ඊ)	2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරය ඉඩම් නියමානුකුල කිරීම සඳහා අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 32 කින් 18 ක් සඳහා	වසම් 11 ක පුද්ගලයින් 537 ක් සඳහා බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී ප්‍රමාදයක් සිදු වී ඇති බව පිළිගනිමි.නමුත් මේ වන	කඩිනම් වැඩපිළිවෙලක් යොදා බලපත්‍ර ලබා දීමට පියවර ගත යුතුය.

	පමණක් ඉඩම් කච්චේරි 2022 වර්ෂය තුල පවත්වා තිබුණද, ඉන් වසම් 10 කට අදාලව සහභාගි වූ 537 දෙනෙකු වෙනුවෙන් බලපත්‍ර ලබාදීමට (දීර්ඝ කාලීන, වාර්ෂික හා ඉඩම් සංවර්ධන ආඥා පනත අනුව) කටයුතු කර නොතිබුණි.	විට අදාල ඉඩම් පිහිටි ස්ථාන පිළිබඳ පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු සිදු කිරීම ආරම්භ කර ඇති බව.	
(උ)	නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අයත් සමෘද්ධි බැංකු 39 ක් විසින් ප්‍රතිලාභීන් 1,755 කට ලබාදෙන ලද ණය මුදලින් රු.125,545,708 ක කල් පසුවු ණය 2024 දෙසැම්බර් 31 වන විටද අයකර ගෙන නොතිබුණි	බොල් ණය අයකිරීම සහ නිලධාරීන් දැනුවත් කර උනන්දු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා කාලීනව ණය අයකිරීමට විධිමත පියවර නොගත් නිලධාරීන්ට අදාළ පියවර ගැනීමත් හිඟ ණය අයකර ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමත් කළ යුතුය.

5. **යහපාලනය**

5.1 **මහජනයා වෙත සේවා ඉටු කිරිම**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 සැප්තැම්බර් 15 දිනැති අංක PC/GPA/Circular/29/2020 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය මගින් රජයේ ආයතන වෙත පැමිණෙන පොදු මහජනතාවට අදාල නිලධාරින් මුණගැසීමට හා ස්වකීය අවශ්‍යතා ඉටුකර ගැනීමට හැකිවනු පිණිස, සියළුම ආයතනවල සේවය කරනු ලබන නිලධාරින් මහජන දිනය වන “සඳුදා”දිනය තුල තම කාර්යාලයේ රැඳී සිටිය යුතු අතර අත්‍යාවශ්‍ය කටයුත්තකදී හැර නිවාඩු ගැනීමෙන් මෙන්ම කාර්යාලයෙන් පිටත වෙනත් කටයුතු යොදා ගැනීමෙන් වැළකිය යුතු වුවද එම විධිවිධාන වලට අනුකූල නොවන ලෙස නියැදි පරීක්ෂාවට ලක්වූ 2024 වර්ෂයේ අවසන් කාර්තුව තුල ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 ක විවිධ තනතුරුවල නිලධාරින් 1432 ක් සඳුදා දින 13 ක් තුල කාර්යාලයේ සේවයට වාර්තා කර නොතිබුණි.	අභ්‍යන්තර නියෝග මගින් අත්‍යවශ කරුණකට හැර නිවාඩු නොගන්නා ලෙසත්,සඳුදා දින ලබා ගන්නා සෑම නිවාඩුවක්ම මා මගින් අනුමත කරවා ගැනීමටත් කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇති බව.	අදාළ විධිවිධාන වලට අනුකූල නොවන නිලධාරීන්ට පියවර ගැනීමටත් මේ සම්බන්ධ අධීක්ෂණය වැඩි කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වාදීමත් කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 සඳහා අනුමත කාර්ය මණ්ඩලය 1610 ක් වුවද, 2024 දෙසැම්බර් 31 දින වන විට ඉන් පුරප්පාඩු 226 ක් පැවතුණි.	මෙම කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අවස්ථා ගණනාවකදී රාජ්‍ය පරිපාලන හා පළාත් සභා,පළාත් පාලන ආයතනය වෙත ලිපි යොමුකර ඇති බව.	කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදුකර අවශ්‍යතාවය මත පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම.